**අඩ්ඩාලච්චේන ප්‍රාදේශිය සභාව**

**අම්පාර දිස්ත්‍රික්කය**

**---------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 අගෝස්තු 20 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 11 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 24 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට අඩ්ඩාලච්චේන ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
------------------------------------------------------------

පළාත් පාලන පළාත් සභා අමාත්‍යාංශය ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීජ්/එස්එෆ්පීඑස්ජ්එස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂන විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු රු. 11,500 ක විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදි යුනොප්ස් (UNOPS) ආයතනයෙන් පරිත්‍යාගයක් වශයෙන් ලැබී තිබූ කාර්යාල උපකරණ 13 ක වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයෙදී පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශිය සභා කාර්යාල ගොඩනැගිල්ල සහ මහජන පොල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ගිවිසුම් ගත වී රු. 15,773,734 ක් සහ රු. 8,294,750 ක කොටස් ගෙවීම් දෙකක් කර තිබුණද, මූල්‍ය ප්‍රකාශන වල රු. 48,643,462 සහ රු. 19,903,523 ක් ගෙවීම් කළ බව පෙන්වා තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල කොන්ත්‍රාත් කරුවන්ට ගෙවීම් පිළිවෙළින් රු. 32,869,728 කින් සහ රු. 11,608,773 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2005 වර්ෂයේදී නැති වූ විදුලි උපකරණ වල වටිනාකම වන රු. 96,392 ක මුදල සමාලෝචිත වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශනවල තොගයේ දක්වා තිබුණි.

(ඉ) සේවක අත්තිකාරම් ණය ශේෂය ගිණුම් කරන දෝෂ හේතුවෙන් රු. 12,500 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ කාර්යාල ලී බඩු උපකරණ සහ යන්ත්‍රෝපකරණ වල එකතු වටිනාකම වන රු. 257,735 ක මුදල ගිණුම්වලට ගෙන නොතිබුණි.

### 1.3.3 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2005 වර්ෂයේදී ප්‍රාදේශිය සභාව විසින් ලංකා විදුලි බල මණ්ඩලයට භාර දෙන ලද භාණ්ඩ වෙනුවෙන් විදුලි බල මණ්ඩලයෙන් අයවියයුතු රු. 350,322 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ස්ථාන මාරුවූ නිලධාරින් 10 දෙනෙකුගෙන් අයකර ගතයුතු රු. 31,875 ණය ශේෂය අදාල ආයතනවලින් අයකර ගැනීම සඳහා 2014 නොවම්බර් 28 දක්වා කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන අයිතමයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| අයිතමය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 133,207,743 | ස්ථාවර වත්කම් ලේඛනය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| උපකරණ සහ මෙවලම් | 116,395 | |
| යන්ත්‍ර යන්ත්‍රෝපකරණ | 734,100 | |
| ලී බඩු සහ සවිකිරීම | 431,365 | |
| අත්තිකාරම් ගෙවීම් | 13,153,987 | අත්තිකාරම් ලේඛනය |
| ගෙවිය යුතු විදුලි උපකරණ ණය | 316,421 | ශේෂ සනාථ කිරීම් ලිපි |

1.3.5 නීති, රීති සහ රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්
-----------------------------------------------------------

පහත සඳහන් නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 12(1) සහ (2) වගන්ති සහ පළාත් පාලන, නිවාස ඉදි කිරීම් සහ ඉදි කිරීම් කර්මාන්ත අමාත්‍යාංශයේ 1988 ජනවාරි 13 වන දින අංක 488/16 දරණ ගැසට් පත්‍ර දැන්වීමේ 31(1) වන උප වගන්ති | ප්‍රාදේශිය සභාවේ කටයුතු ලිහිල් කිරීමේ අදහසින් අංගසම්පූර්ණ තීරණ ගැනීම සඳහා සහ උපදෙස් ලබා දීම සඳහා සභාවේ මුදල්, ප්‍රතිපත්ති සැලැසුම්, නිවාස ඉදිකිරීම්, සමාජ සංවර්ධන, තාක්ෂන සේවා, පාරිසරික සහ පොදු පහසුකම් යන කරුණු සඳහා වෙන් වශයෙන් කාරක සභා පත්කල තිබුණද මුදල් හැර අනිකුත් කාරක සභා සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක වී නොතිබුණි. |
| (ආ) මුදල් රේගුලාසි 571(2) | 1998 වර්ෂයේ සිට 2013 වර්ෂයේ අවසානය දක්වා තැන්පත් ගිණුමේ පෙන්වා තිබූ පිළිවළින් රු. 689,311 ක් සහ රු. 200,000 ක් හදුනා නොගත් සහ කල් ඉකුත්වූ තැන්පත් අදාල පාර්ශවයන්ට ගෙවීමට හෝ ආදායමට මාරු කිරීමට 2014 නොවැම්බර් 28 දින දක්වා කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 8,360,916 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 3,518,959 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,841,957 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 වරිපනම් හා බදු
-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134, 158 සහ 159 වගන්තිවලට අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයතුල තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි වලින් 2003 වර්ෂයේ සිට 2013 වර්ෂය අවසානය දක්වා වරිපනම් බදු ගණනය කර අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලොචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේදී වරිපනම් බදු වශයෙන් රැස්කිරීමට ඇස්තමේන්තුකර තිබූ රු. 252,000 ක මුදලින් 16.5% වන රු. 41,669 ක මුදලක් පමණක් අයකරගෙන තිබුණි.

(ඇ) 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදයට අදාල හිඟ මස්කඩ බදු ශේෂය රු. 273,300 ක් අයකර ගැනීම සඳහා 2014 නොවැම්බර් 28 දින දක්වා කටයුතු කර නොතිබුණි.

2.2.2 බලපත්‍ර ගාස්තු

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව වෙළඳ සැල් සහ ආයතක පවත්වා ගෙන යාම වෙනුවෙන් සහ බලපත්‍ර ගාස්තු වශයෙන් අයකර ගැනීම සඳහා ඇස්තමේන්තු කර තිබූ මුදල රු. 1,100,500 කි. ඉන් 43.72% වන රු. 477,360 ක මුදලක් අයකර ගෙන තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය අනුව සභාව විසින් ආදායම් අයකර ගැනීමට අදාල අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට නොහැකි වීම නිසා සභා බල ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයන් තමන්ගේ වෙළඳ භාණ්ඩ ප්‍රචාරය කිරීම සඳහා ස්ථාපිත කරන ලද ප්‍රචාරක පුවරු 15 කින් අයවිය යුතු රු. 74,350 ක ගාස්තුව අයකර නොතිබුණි.

2.2.3 විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු අයකිරීම

------------------------------------------------

ප්‍රාදේශ සභා බල ප්‍රදේශයේ 2009 වර්ෂය සිට 2013 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයේ ස්ථාපිත කරන ලද විදුලි සංදේශය කුළුණු 12 ක් සම්බන්ධව අයකර ගතයුතු රු. 425,000 ක බලපත්‍ර ගාස්තු මුදල 2014 නොවැම්බර් 28 වන දින දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

---------------

2012 සහ 2013 වර්ෂයන් වෙනුවෙන් ලැබීය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය වන රු. 1,164,264 ක මුදල රෙජිස්ටාර් ජනරාල් ගෙන් ලබා ගැනීම සඳහා 2014 නොවැම්බර් 28 වන දින දක්වා කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමණාකරන අකාර්යක්ෂමතා

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශිය සභාව විසින් රු. 1,100,000 ක් මුදලකට සෝඩියම් වර්ගයේ විදුලි බුබුලු 80 ක් මිලදීගෙන සවිකර තිබුණද එයින් විදුලි බුබුලු 21 ක්ම ක්‍රියාකාරී තත්වයේ නොතිබුණු අතර අනෙකුත් විදුලි බුබුලු 59 ක්ම මාස 08 කට වඩා වැඩි කාලයක් නිෂ්ක්‍රියව පැවතිණි.

(ආ) පාලමුනේ සහ අඩ්ඩාලච්චේන මහජන ක්‍රීඩා භූමියේ වර්ග 06 කට අයත් පළතුරු ගස් 45 ක් රු. 18,360 ක් මුදලකටත් ඒවා ආරක්ෂා කිරීම් සඳහා කූඩු 20 රු. 38,000 ක මුදලකටත් මිලදී ගෙන තිබුණද, 2014 නොවැම්බර් 26 දී පවත්වන ලද භෞතික පරීක්ෂනයේදී ආරක්ෂක කූඩු 12 ක් පමණක් අදාල ක්‍රීඩා භූමියේ තිබුණු බැවින් සභාව විසින් මේ සඳහා වැය කරන ලද රු. 56,360 ක මුදල නිෂ්ඵල වියදමක්විය.

(ඇ) අඩ්ඩාලච්චේන මහජන ක්‍රීඩා භූමියේ විවෙක කාමරයක් සහ වැසිකිලි ඉදිකිරීම සම්බන්ධයෙන් 2012 මැයි 25 දින සභා අරමුදලින් ප්‍රජා සමිතියකට රු. 474,911 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබු අතර ඉදි කිරීම් කටයුතු නිම කර තිබූ නමුත් 2014 නොවැම්බර් 26 දින දක්වා එම අත්තිකාරම් මුදල පියවා නොතිබුණි.

(ඈ) 2012 සහ 2013 වර්ෂ සඳහා ප්‍රාදේශිය සභාව විසින් පවත්වන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂන වාර්තා අනුව භාණ්ඩ වර්ග 24 ක වත්කම් 198 ක ඌණතාවයක් පෙන්වා තිබුනද ඒ සම්බන්ධයෙන් 2014 නොවැම්බර් 26 වන දින දක්වා කළමණාකරනය විසින් නිසි පියවර ගෙන නොතිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

3.2.1 මහජන පොල ගොඩනැගිල්ල ඉදි කිරීම

-------------------------------------------

මහජන පොල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු. 16,345,000 ක මුදලකට ප්‍රාදේශිය සභාව විසින් කොන්ත්‍රාත් ලබා දී තිබුණු අතර කොන්ත්‍රාත් ගිවිසුම් අනුව 2014 අගෝස්තු 31 වන දින වැඩ නිම කලයුතු වුවද, දින 86 ක ප්‍රමාදයෙන්පසු වැඩ නිමකර තිබු අතර ගිවිසුමේ සඳහන් පරිදි ප්‍රමාද කාලය සඳහා, ප්‍රමාද දඩ මුදල රු. 764,153 ක මුදල කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොතිබුණි.

3.2.2 කාර්යාලය ගොඩනැගිල්ල ඉදිකිරීම

---------------------------------------

කාර්යාලය ගොඩනැගිල්ල ඉදිකිරීම් සඳහා ප්‍රාදේශිය සභාව විසින් රු. 43,431,938 ක මුදලකට කොන්ත්‍රාත් භාරදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිවිසුමේ සඳහන් පරිදි ගිවිසුම් කාලය තුල කොන්ත්‍රාත් කරුවන්ගෙන් අත්සන්කර ලබා ගැනීම සඳහා රු. 8,686,787 ක මුදලකට පෞද්ගලික බැංකුවක් මගින් අත්තිකාරම් බැඳුම්කරයක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත්කර තිබුණි. බැංකුව විසින් විගණනයට ලැබුණු තොරතුරු අනුව කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් කාලය දීර්ග කල බවට ඉදිරිපත්කරන ලද අත්තිකාරම් බැඳුම්කරය අදාල බැංකුවෙන් නිකුත් නොකරන ලද ව්‍යාජ එකක් බව තහවුරු විය.

(ආ) ගිවිසුමේ සඳහන් පරිදී ගිවිසුම් කාලයතුල කොන්ත්‍රාත්වරුන් විසින් වැඩ නිමවන කාලය දක්වා රු. 2,171,700 ක මුදලකට පෞද්ගලික බැංකුවක් මගින් ලබාගත් කාර්‍ය්‍ය සාධන බැඳුම්කර 02 ක් කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබුණි. බැංකුව විසින් විගණනයට ලද තොරතුරු අනුව කොන්ත්‍රාත්කරු විසින් කාලය දීර්ඝ කිරීම වෙනුවෙන් ඉදිරිපත් කල කාර්‍ය්‍ය සාධන බැඳුම්කර එම බැංකුවෙන් නිකුත් කරණ ලද එකක් නොව ව්‍යාජ එකක් බව තහවුරු විය.

(ඇ) මෙසේ කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාජ අත්තිකාරම් සහ කාර්ය සාධන බැඳුම්කර ඉදිරිපත් කර තිබුණද සභාව විසින් කොන්ත්‍රාත්කරුට විරුද්ධව කිසිම ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

එක් එක් පළාත් පාලන ආයතන තම තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බවට වූ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තිය පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) කොන්ත්‍රාත් පාලනය